ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக்குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Human Rights Commission of Sri Lanka

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4).

Ranjith Uyangoda
Secretary
Human Rights Commission of Sri Lanka

ආකෘති 1

183

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

1 කොටස 85.00

කම්ටුව විසින් හඳුනාගත් අඩුපාඩු හා විශේෂ අවධානය යොමු කළ යුතු අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
1 .රජයේ නිලධාරීන්ගේ ගිණුමට අත්තිකාරම් මුදල් නියමිත දිනට ඉදිරිපත් නොකිරීම	මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා රජයේ නිලධාරීන් නොමැති අතර ඒ අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමක් නොමැත.
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබීම	2021 වර්ෂයේ සිට යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදු කර ඇත.
3. 2017.06.26 දින අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 07 ජේදය ප්‍රකාරව 2018 වර්ෂයට අදාල වත්කම් මලදි ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු පාලක ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම	2022 වර්ෂයට අදාලව යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කොට ඇත.
4.දෛනික ධාවන වාර්තා සහ/හෝ වාහන සඳහා සංචිත වාහන වල මාසික සාරාංශ සකස් කර නොතිබීම හා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 ජේදයේ විධිවිධාන ප්‍රකාරව විශේෂ වියදම් ඒකකයට අයත් වාහන වල ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා නොකිරීම	දෛනික වාර්තා සටහන් වල මාසික සාරාංශ යාවත්කාලීන කොට 2022 සිට මේ දක්වා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2020 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වූ අතර, අද වන විට ප්‍රමාණවත් ඉන්ධන ලබා නොදීම හේතුවෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොමැත. ඉන්දන ලබා දීම යථාතත්වයට පත් වූ වහාම ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරනු ලැබේ.
5. 2002.09.13 දින රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 402 ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150ක් ඇතුලත වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කර නොතිබීම හා විගණකාධිපතිවරයාට පිටපත සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම	2020 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023.01.31 දිනැතිව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. පිටපතක් විගණකාධිපති වෙත ලබා දී ඇත.

2 කොටස 75.00

1. සමස්ත කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර හෝ ඇතුලත් කර නොතිබීම	මේ පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විමසීමේ දී එය ක්‍රියාත්මක වන තත්වයේ නොපවතින බව ද එය පිළියෙල කිරීම පිළිබඳ කිසිදු උපදෙසක් ලැබී නොමැති බව ද සඳහන් කරමි.

Ranjith Uyangoda
Secretary
Human Rights Commission of Sri Lanka